රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/2015

මගේ අංකය : CS/SLAS/AMEN/MINUT(II වෙළුම)
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2015 අප්‍රේල් මස 23 වෙනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම.</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005 නොවැම්බර් 14 දිනැති අංක 1419/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2005.10.28 දිනැති ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට ආදේශ කරනු ලැබූ, 2013.12.23 දිනැති අංක 1842/2 අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නව ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2012 ජූලි මස 01 දින සිට ක්‍රියාත්මක වේ.

**02. <u>කාර්යක්ෂමතා කඩඉම්</u>**

I. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් අංක 1842/2 දරන හා 2013.12.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සිය පරිවාස කාලය හෝ පත්වීම් දින සිට වසර 03 ක් තුළ හෝ සිය පත්වීම් දින සිට පවත්වනු ලබන පළමු විභාගවාර 04 තුළදී සම්පූර්ණ කළ යුතුය. එසේම දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය දෙවන ශ්‍රේණියට පත්කරනු ලැබ වසර 03 ක් තුළ හෝ දෙවන ශ්‍රේණියට පත් කරනු ලැබීමෙන් පසු පවත්වනු ලබන පළමු විභාගවාර 04 තුළදී සම්පූර්ණ කළ යුතුය.

II. 2012.07.01 සිට 2013.12.23 දක්වා බඳවා ගනු ලැබූ නිලධාරීන්, අංක 1419/3 දරන හා 2005.11.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2005.10.28 දිනැති පූර්ව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව 2014.12.31 දක්වා පවත්වනු ලැබූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලදී පහත දැක්වෙන විෂයන් සමත්වීම මත පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවල අදාළ විෂයන් සමත්වූවා ලෙස සැලකේ.

| | අංක 1419/3 හා 2005.11.14 දිනැති පූර්ව සේවා ව්‍යවස්ථාව | අංක 1842/2 හා 2013.12.23 දිනැති නව සේවා ව්‍යවස්ථාව |
|---|---|---|
| 1. | නීතිය<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | නීතිය<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 2. | පරිපාලනය<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | පරිපාලනය<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 3. | ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 4. | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය<br>(දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය (පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |
| 5. | ඉංග්‍රීසි<br>(පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) | සන්ධාන භාෂා ප්‍රවීණතාව<br>(දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය) |

III. 2012.07.01 දිනට පෙර බලාත්මක වූ ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් විය යුතුව තිබූ නමුත් 2014.12.31 දක්වා එසේ සමත් වීමට අපොහොසත් වන නිලධාරීන් එම ව්‍යවස්ථාවන්ට අනුව, අදාළ කඩඉම් පරීක්ෂණයේ විෂයන්ට අනුරූපී සේවා ව්‍යවස්ථාවේ II උපලේඛනයේ 1.5 (ආ) යටතේ දක්වා ඇති අදාළ විෂයන් සමත් වීමෙන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කල යුතුය.

IV. 2014.12.31 දක්වා පූර්ව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පවත්වනු ලැබූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් නොවුන අවස්ථාවේදී නව සේවා ව්‍යවස්ථාව යටතේ පවත්වනු ලබන පළමු හෝ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලට පෙනී සිට සේවා ව්‍යවස්ථාවේ II උපලේඛනයේ 1.5 (ආ) යටතේ දක්වා ඇති අදාළ විෂයන් සම්පූර්ණ කිරීමට අවස්ථාව ලබාදේ.

සටහන:

1. නව සේවා ව්‍යවස්ථාවේ දැක්වෙන අන්තර් කාලය තුළ සේවයේ ස්ථිර කරනු ලබන, 2014.12.31 දක්වා පූර්ව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පවත්වනු ලැබූ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යටතේ වන රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය විෂයය සමත් වී නොමැති නිලධාරීන්, නව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පවත්වනු ලබන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යටතේ වන රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විෂයය, II වන ශ්‍රේණියට උසස් වීමට පෙර සමත් විය යුතුය.

2. එකී අන්තර් කාලය තුළ සේවයේ ස්ථිර නොවුන නිලධාරීන්, ඉන් පසුව සේවයේ ස්ථිර කිරීමට නම් නව සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පවත්වනු ලබන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යටතේ වන රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විෂයය සමත් වී තිබිය යුතුය.

3. **<u>ඉහත 2. හි නිලධාරීන් හට</u>** 2013.12.31 දින සිට පවත්වනු ලබන **<u>අනුගාමී</u>** විභාග වාර 04 කට පෙනී සිට රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විෂයය සමත් වීම සඳහා සහන කාලයක් ලබා දෙනු ලැබේ.

V. පූර්ව සේවා ව්‍යවස්ථාව අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සේවයට පත්කරන ලද දින සිට වසර 06 ක් තුළ සමත් විය යුතුව තිබුණද, නව සේවා ව්‍යවස්ථාව අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු වන්නේ II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගතවීමට පෙර වේ. ඒ අනුව පූර්ව සේවා ව්‍යවස්ථාව අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වසර 06 ක් තුළ සමත් නොවීම හේතුවෙන් වැටුප් වර්ධක විලම්භනය කර ඇති නිලධාරීන් හට නව සේවා ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2013.12.23 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත වැටුප් වර්ධක ලබා දිය හැක.

සටහන:

**<u>උදාහරණයක් ලෙස 2006.10.02 දින පත්වීම් ලබා වසර 06 ක් ඇතුළත</u>** (එනම් 2012.10.02 දිනට පෙර) සිය දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ යුතුව තිබූ, එහෙත් 2013.12.23 දක්වා එම කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ නොකළ නිලධාරියෙකුගේ වාර්ෂික වැටුප් වර්ධක 2012.10.02 සිට 2013.12.22 දක්වා පමණක් විලම්භනය වේ.

VI. නව සේවා ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළ කරන ලද 2013.12.23 වන දිනට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබ 2013.12.23 දිනට I ශ්‍රේණියේ වසර පහක (05)ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් තුන්වන (III) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. 2008.12.23 සිට 2013.12.23 දක්වා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියට / I ශ්‍රේණියට උසස්වීම් ලැබූ නිලධාරීන්ට නව සේවා ව්‍යවස්ථාවේ සඳහන් තුන්වන (III) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම සඳහා වසර දෙකක අමතර සහන කාලයක් ලබා දෙනු ලැබේ.

VII. නව සේවා ව්‍යවස්ථාවේ හෝ පූර්ව සේවා ව්‍යවස්ථාවල සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I, II, III ශ්‍රේණිවල නිලධාරීන් විසින් නියමිත දිනට පෙර සම්පූර්ණ කළ යුතු අතර, එසේ නොවන අවස්ථාවලදී එම නිලධාරීන්ගේ වාර්ෂික වැටුප් වර්ධක අදාළ පරිදි විලම්භනය වේ.


**03.** <u>නිදහස් කිරීම්</u>

I. නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2012.07.01 දිනට පෙර බඳවාගත් නිලධාරීන් සඳහා ඔවුන් බඳවාගත් සේවා ව්‍යවස්ථා යටතේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ හා භාෂා ප්‍රවීණතා අවශ්‍යතා වලින් නිදහස් වීමට ලබා දී තිබූ විධිවිධාන එම නිලධාරීන් සඳහා තවදුරටත් ක්‍රියාත්මක වේ. ඒ පිළිබඳ විස්තර ඇමුණුම 01 හි දක්වා ඇත.

II. නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2012.07.01 දිනට පසු බඳවාගත් නිලධාරීන් පහත සුදුසුකම් සම්පූර්ණ කර තිබේනම් පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ නීතිය විෂයය සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

1. බැරිස්ටර්වරයෙකු හෝ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු වීම.
2. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය ඇතිව වේ.



ජේ. දඩල්ලගේ

ලේකම්,

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය

**පූර්ව සේවා ව්‍යවස්ථා යටතේ කරනු ලැබූ නිදහස් කිරීම්**

(01) අංක 509/7 හා 1988.06.07 දිනැති සේවා ව්‍යවස්ථාව යටතේ සිදු කරනු ලැබූ නිදහස් කිරීම්

පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

| විෂය | නිදහස් කිරීම |
|---|---|
| නීතිය | 1. බැරිස්ටර්වරයෙකු හෝ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු වීම.<br>2. පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම. |
| සමාජ විද්‍යාව | පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම. |
| ආර්ථික විද්‍යාව | පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම. |
| ඉංග්‍රීසි | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සේවාරම්භක පුහුණුව අවසානයේ පවත්වනු ලබන ඉංග්‍රීසි පරීක්ෂණයෙන් සමත් වී තිබීම. |

දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

| විෂය | නිදහස් කිරීම |
|---|---|
| කළමනාකරණය හා සංවිධානය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන සේවාරම්භක පුහුණුව සම්පූර්ණ කර තිබීම. |

භාෂා ප්‍රවීණතාවය

| විෂය | නිදහස් කිරීම |
|---|---|
| දෙවන භාෂා පරීක්ෂණය | අ.පො.ස (සා.පෙළ) ඉංග්‍රීසි විෂය සමත් වී තිබීම. |

(02) අංක 1419/3 හා 2005.11.14 දිනැති සේවා ව්‍යවස්ථාව අනුව කරනු ලැබූ නිදහස් කිරීම්

පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

| විෂය | නිදහස් කිරීම |
|---|---|
| නීතිය | 1. බැරිස්ටර්වරයෙකු හෝ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු වීම.<br>2. පිළිගත් විශ්ව විද්‍යාලයක නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම. |
| සමාජ විද්‍යාව | පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම. |
| ආර්ථික විද්‍යාව | පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම. |

භාෂා ප්‍රවීණතාවය

| විෂය | නිදහස් කිරීම |
|---|---|
| අනෙක් රාජ්‍ය භාෂා (සිංහල/දෙමළ) ප්‍රවීණතාවය<br>(සේවා ව්‍යවස්ථාවේ 11 වන වගන්තියෙහි දැක්වෙන)<br>**සංලක්ෂය**<br>2012.01.02 දිනැතිව හෝ ඉන් පසුව සීමිත හා විවෘත පදනම මත බඳවා ගනු ලැබූ නිලධාරීන්ට අදාල නොවේ. | 1. අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් පළමු භාෂාව හෝ දෙවන භාෂාව ලෙස අනෙක් රාජ්‍ය භාෂාව සමත් වීම<br>2. අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් වෛකල්පිත විෂයක් ලෙස අනෙක් රාජ්‍ය භාෂාව සමත් වීම<br>3.රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ මූලික හෝ උසස් භාෂා පාඨමාලාවන් සමත් වීම<br>4. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රාරම්භක හෝ ඉහළ මට්ටමක භාෂා පාඨමාලා සමත් වීම |
| සන්ධාන භාෂා ප්‍රවීණතාවය<br>(අංක 1458/2 හා 2006.08.14 දිනැති සේවා ව්‍යවස්ථා සංශෝධනය අනුව 11 (II) වන වගන්තියෙහි දැක්වෙන) | අ.පො.ස (සා.පෙළ) ඉංග්‍රීසි විෂය සමත් වී තිබීම. |